# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1903/6 – 2015 පෙබරවාරි 24 වැනි අඟහරුවාදා – 2015.02.24**

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය - සී. අයි/ 1829.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

එක් පාර්ශවයක් වශයෙන් කොළඹ 01, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ අංක 75 දරන ස්ථානයේ පිහිටා ඇති ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සහ අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 01, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ අංක 75 දරන ස්ථානයේ පිහිටා ඇති ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය, කොළඹ 01, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ අංක 75 දරන ස්ථානයේ පිහිටා ඇති රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථා විධායක වෘත්තීය සමිතිය, කොළඹ 01, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ අංක 75 දරන ස්ථානයේ පිහිටා ඇති ජාතික සේවක සංගමය, කොළඹ 01, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ අංක 75 දරන ස්ථානයේ පිහිටා ඇති එක්සත් රාජ්‍ය සේවා ඖෂධ සංස්ථා සේවක සංගමය, කොළඹ 05, ඊ. ඩී. දාබරේ මාවතේ අංක 158/18 දරන ස්ථානයේ පිහිටා ඇති ඖෂධ සංස්ථා සේවක සංගමය, නුගේගොඩ රේල්වේ ඇවිනියු හි අංක 43/1/1 දරන ස්ථානයේ පිහිටා ඇති රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථා ඖෂධවේදීන්ගේ සංගමය අතර 2014 නොවැම්බර් මස 28 වන දින ඇතිකරගන්නා ලද සාමූහික ගිවිසුම (ඉංග්‍රීසි භාෂාවෙන් සහ සිංහල හා දමිළ භාෂාවන්ට පරිවර්ථනය කිරීමෙන්) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිඡේදය වන (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනතේ 06 වන වගන්තිය අනුව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**හේරත් යාපා,**
කම්කරු කොමසාරිස්.

2015 පෙබරවාරි මස 10 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුව.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2014 අංක 41 දරන සාමූහික ගිවිසුම

**එක් පාර්ශවයක් ලෙස කොළඹ 01, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සහ
අනෙක් පාර්ශවය ලෙස ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය සහ
තවත් වෘත්තීය සමිති පහක් අතර අත්සන් තැබූ
සාමූහික ගිවිසුම - 2014**

එක් පාර්ශවයක් ලෙස 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත සහ 1971 සැප්තැම්බර් 22 වන බුද දින අංක 14, 976/3 - 1971 දරන ගැසට් නිවේදනය අනුව ස්ථාපනය කරනු ලැබූ කොළඹ 01, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ සිය ප්‍රධාන කාර්යාලය පිහිටියා වූ ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සහ (මෙහි මින් මතු රා. ඖ. ස. ලෙස සඳහන් කරනු ලබන) සහ පහත දැක්වෙන වෘත්තීය සමිති අතර 28.11.2014 දින මෙම සාමූහික ගිවිසුම අත්සන් තබනු ලැබේ.

1. ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය
2. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථා විධායක වෘත්තීය සමිතිය
3. ජාතික සේවක සංගමය
4. එක්සත් රාජ්‍ය සේවා ඖෂධ සංස්ථා සේවක සංගමය
5. ඖෂධ සංස්ථා සේවක සංගමය
6. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථා ඖෂධවේදීන්ගේ සංගමය

මෙම සාමූහික ගිවිසුම ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සහ මෙහි මින් පෙර සඳහන් කළ රා. ඖ. සංස්ථාවේ සියලු වෘත්තීය සමිති අතර සාමූහික ගිවිසුම 2014 ලෙස හඳුන්වනු ලබන්නේය සහ සඳහන් කරනු ලබන්නේය.

1. **බැඳී සිටීමට නියමිත සේව්‍යයා.–** ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව.

2. **ආවරණය වීමට සහ බැඳී සිටීමට නියමිත සේවකයන්.–** වෙනත් දේ අතර මෙම සාමූහික ගිවිසුමේ *ඇමුණුම 1* හි දක්වා ඇති වැටුප් පරිමාණයන්හි අදාළ කාණ්ඩයන්ට අයත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සියළුම ස්ථිර සේවකයන් මෙම සාමූහික ගිවිසුම මගින් ආවරණය කරන්නේය, ඉන් බැඳී සිටින්නේය.

3. **ක්‍රියාත්මක වන දිනය සහ කාලසීමාව.–** මෙම ගිවිසුම 2014 වසරේ 2014 ජූලි 01 වන දින සිට ක්‍රියාත්මක වන අතර පාර්ශව දෙකින් කවරක් හෝ අනෙක් පාර්ශවයට ලියවිල්ලකින් මාස හයක දැනුම් දීමක් ලබාදීමෙන් සමාපනය කරන්නේ නම් හැර ඉන් අනතුරුව අඛණ්ඩව ක්‍රියාත්මකව පැවැතිය යුතු අතර, එතකුදු වුවත් මෙම ගිවිසුමේ දින සිට මාස 30 ක කාල සීමාවක් ඉක්මවන තුරු කවර හෝ පාර්ශවයක් අනෙක් පාර්ශවයට එබඳු දැනුම්දීමක් නොකළ යුතු අතර, එබඳු දැනුම් දීමක් බලාත්මක වන්නේ මෙම ගිවිසුමේ දින සිට මාස 36 ක් ඉකුත් වීමෙන් පසුවය.

4. මෙම ගිවිසුම කල් ඉකුත්වීමට පෙර, මෙම ගිවිසුමේ නියම සහ කොන්දේසි සාකච්ඡා කිරීම සඳහා හෝ නව සාමූහික ගිවිසුමක් සම්පාදනය කිරීම සඳහා සාකච්ඡා ආරම්භ කළ යුතු බවට පාර්ශවයන් එකඟ වන්නේය.

5. **ආවරණය වන කරුණු සහ සේවා නියුක්තියේ නියම සහ කොන්දේසිවලට විචලන සහ ප්‍රතිලාභ.–** මෙම සාමූහික ගිවිසුම මෙහිලා ආවරණය කර ඇති සියලු කරුණු පිළිබඳව මෙන්ම දැනටමත් අදාළ සාකච්ඡා පවත්වා ඇති සහ මෙම ගිවිසුම ලියා අත්සන් කිරීමට පෙර සියල්ලන් විසින් එකඟ වූ කරුණු සහ මෙම ගිවිසුමේ දින සිට මාස 36 ක (වසර 3) කාලසීමාවකට අදාළව එකී වෘත්තීය සමිති සාමාජිකත්වය නියෝජනය කරන්නා වූ නියෝජිතයන් විසින් මතු කරනු ලැබූ සියලු කරුණු සම්බන්ධයෙන් පූර්ණ සහ අවසාන නිරාකරණය විය යුතු බවට එකඟ වන්නේය. එහෙයින්, මෙහි පිළිබිඹු වන ආකාරයට පාර්ශවයන් විසින් සාකච්ඡා කරන ලද, ප්‍රතිදානය කරන ලද සහ එකඟවන ලද කරුණු මෙම සාමූහික ගිවිසුම පවත්නා තාක් කල් බලාත්මකව පවතින අතර මෙම සාමූහික ගිවිසුමේ කාලසීමාව අතරතුර රා.ඖ.සංස්ථාවේ කිසිදු වෘත්තීය සමිතියක් අකුරට වැඩ කිරීම, දොර වාඩි ලෑම, වර්ජනය කිරීම ආදී වෘත්තීය සමිති ක්‍රියාකාරකම්වල නිරත නොවන අතර සංස්ථාවේ සේවකයන්ට ප්‍රදානය කර ඇති සියයට 25 හෝ ඊට වැඩි වාර්ෂික වැටුප් වර්ධකය හැරුණු විට මෙම ගිවිසුමේ ප්‍රතිපාදන සලස්වා ඇති පරිදි සේවා නියුක්තියේ නියම සහ කොන්දේසි හෝ අදාළ හෝ භුක්තිවිඳින්නාවූ ප්‍රතිලාභ වෙනස් නොකිරීමට, විවර්තනය නොකිරීමට හෝ අළුතින් එක් නොකිරීමට එකඟ වන්නේය.

6. **වැටුප් සංරචක.–** මෙම සාමූහික ගිවිසුම ලියා අත්සන් කළ දින සිට, මෙම ගිවිසුමෙන් ආවරණය කරනු ලබන සහ ඉන් බැඳී සිටින සෑම සේවකයකුටම, මෙහි අන්තර්ගත අනෙකුත් නියම සහ කොන්දේසි මත සහ ඊට යටත්ව පහත දැක්වෙන සංරචකවලින් සමන්විත මාසික වැටුපත් ගෙවිය යුතුය.

(i) මහා භාණ්ඩාගාර ලේකම්ගේ 2014.11.19 දිනැති ලිපියට අමුණා ඇති ඇමුණුම i පරිදි

(ii) තවද ;

(අ) භාණ්ඩාගාරයේ ලේකම් හෝ රාජ්‍ය පරිපාලන ලේකම් විසින් නිකුත් කරන ලද කවර හෝ චක්‍රලේඛයක් (රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල අදාළ වන්නා වූ චක්‍රලේඛ පමණක්) ප්‍රකාරව සංස්ථා සේවකයන්ට ලබා දෙන කවර හෝ වාසියක් අදාළ පරිදි රා.ඖ.ස. සේවකයන්ට අඛණ්ඩවම අදාළ වනු ඇත, සහ

(ආ) වෙනම ජීවන වියදම් දීමනා ගැලපීමක් මෙම සාමූහික ගිවිසුමේ කොටසක් සංස්ථාපනය නොකරන බැවින්, වාර්ෂික අයවැය මගින් ප්‍රකාශයට පත් කිරීමට ඉඩ ඇති ජීවන වියදම් දීමනාව හෝ ආශ්‍රිත ගැලපීම් අදාළ පරිදි රා.ඖ.ස. සේවකයන්ට ද ලබාදෙනු ඇත.

(ඇ) රජය විසින් අනුමත ඉන්ධන දීමනාව ඇතුළුව වාහන ප්‍රතිලාභ සඳහා හිමිකම් ඇති සේවකයන්ට ගමන් වියදම් දීමනාව අදාළ නොවනු ඇත.

(ඈ) සේවකයන් විසින් භුක්ති විඳින වැටුප් නොවන අනෙකුත් සියළු ප්‍රතිලාභ වෙනම අඛණ්ඩවම පවත්වාගෙන යනු ලබන අතර මහ භාණ්ඩාගාරයෙන් පූර්ව අනුමැතිය ලැබෙනුයේ නම් හැර වෙනස් නොවනු ඇත.

7. **වේතන මත බදු.–** කිසියම් සැකයක් පරිවර්ජනය සඳහා, වේතන මත උපයන විට ගෙවීමේ බදු සේවකයන් විසින් නොකඩවා දැරිය යුතු බව පිළිගනු ලැබේ.

8. **පවත්නා වැටුප යෝජිත වැටුප වෙත පරිවර්තනය කිරීමේ ක්‍රමවේදය.–** අමුණා ඇති වැටුප් පරිමාණ පරිදි සේවක වැටුප් පියවර සඳහා පියවර (ලක්ෂ්‍යයෙන් ලක්ෂ්‍යයට) ක්‍රමවේදය යොදාගනිමින් ප්‍රතිශෝධිත පරිමාණයට පරිවර්තනය කරනු ඇත.

උදා : මෙම ගිවිසුම ක්‍රියාත්මක වන දිනයට ආසන්නතම පෙර දිනයට පරිමාණයේ 05 වන පියවරේ සිටින සේවකයෙකු මෙම සාමූහික ගිවිසුම ක්‍රියාත්මක වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ ප්‍රතිශෝධික පරිමාණයේ 05 වන පියවරේ තබනු ඇත.

9. **පරිවර්තන විෂමතා.–** වැටුප් වර්ධක ගණනය කිරීම හා ආශ්‍රිත කිසියම් විෂමතාවක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ එක් සාමාජිකයෙක්, භාණ්ඩාගාර නියෝජිතයෙක්, රා.ඖ. සංස්ථාවේ නියෝජිතයන් (සාමාජිකයන් 03 දෙනෙකු) සහ අදාළ සේවකයන් අයත් වෘත්තීය සමිතියේ සභාපතිවරුන්ගෙන් සමන්විත කමිටුවක් වෙත යොමු කරන්නේය යන පදනමින් මෙම ගිවිසුම ලියා අත්සන් කිරීමට පාර්ශව ඒකාබද්ධව එකඟ වේ. මෙම ගිවිසුමේ දිනයේ සිට මාසයක් ඇතුළත එකී කමිටුව පත්කළ යුතු අතර එහි නිර්දේශ එතැන් සිට මාස 3ක් ඇතුළත ලබා දිය යුතුය.

10. **අනෙකුත් බැඳීම්.–** සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඇණවුම්කරන ප්‍රසම්පාදන ඇණවුම් නොමැතිව වසර අවසානයේදී, රා.ඖ.සංස්ථාව මගින් සිය පිරිවැටුමෙහි 10% ක වර්ධනයක් සාක්ෂාත් කර ගැනීම පිණිස රා.ඖ.සංස්ථාවේ මෙහෙයුම්වල ඵලදායීත්වය ඉහළ නැංවීමට සේවකයන් සියලු ප්‍රයත්න දරන බවට වෘත්තීය සමිති එකඟ වන්නේය.

11. **ආවරණය කිරීමට නියමිත ආනුෂංගික කරුණු.–** මෙම ගිවිසුමෙහි ක්‍රියාමාර්ග ගෙන නොමැති එයට ආනුෂංගික අනෙකුත් සියළු කරුණු තත් කාලයේ බලපවත්නා නීති, රෙගුලාසි සහ චක්‍රලේඛ උපදෙස් අනුව පාලනය කළ යුතු බවට පාර්ශව මින් එකඟ වනු ලැබේ. එතුකුදුවුවත්, තම සාමාජිකයන්ට අසාධාරණයැයි වෘත්තීය සමිති සළකන කවර හෝ කරුණක් මතු කිරීමට ඇති අයිතිය එම සමිති රඳවා ගනියි.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සඳහා සහ එය වෙනුවෙන්

01. සභාපති
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

..................................................................

02. කළමනාකාර අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

..................................................................

සාක්ෂිකරුවෝ ៖ -

01. සාමාන්‍යාධිකාරී - ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

..................................................................

02. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල්
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

..................................................................

03. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - මානව සම්පත් සහ පරිපාලන
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

.......................................................................

මෙහි පහත සඳහන් වෘත්තීය සමිති සඳහා සහ වෙනුවෙන්

01. ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය

.......................................................................

02. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථා විධායක වෘත්තිය සමිතිය

.......................................................................

03. ජාතික සේවක සංගමය

.......................................................................

04. එක්සත් රාජ්‍ය සේවා ඖෂධ සංස්ථා සේවක සංගමය

.......................................................................

05. ඖෂධ සංස්ථා සේවක සංගමය

.......................................................................

06. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථා ඖෂධවේදීන්ගේ සංගමය

.......................................................................

03 - 263

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.